පොල්ගහවෙල ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
--------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 ජූලි 14 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට පොල්ගහවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

2014 වර්ෂයේදී ඉදිකිරීම් නිමකළ ගොඩනැගිල්ල සඳහා අදාල ඉදිකිරීම් සමාගමට රු.52,399,386 ක් ගෙවීම් කර තිබූ නමුත් මූල්‍ය ප්‍රකාශනවල එම වටිනාකම රු.53,585,041 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව රු.1,185,655 ක් ගොඩනැගිලි වටිනාකම වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

#### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 09 කට අදාල උපයෝගී ලේඛනවල ශේෂයන් සමඟ රු.8,286,350 ක නොසැසදීම් පැවතුණි.

#### 1.3.3 ලැබිය යුතු ගිණුම්

2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ වටිනාකම රු.76,257,948 ක් වූ අතර රු. 11,140 ක් වසර 03 කට වැඩි කාලයක සිට පැවත එන අගරු වෙක්පත් ශේෂයක් විය.

#### 1.3.4 ගෙවිය යුතු ගිණුම්

2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.69,979,154 වූ අතර ඉන් සියයට 13 ක් හෙවත් රු. 9,167,828 ක් වසර 03 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂයන් විය.

**1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

(අ) රු.11,675,717 ක් වටිනා ගිණුම් විෂයයන් 05 කට අදාල තැන්පත් ලේඛන, උපලේඛන යනාදී සාක්ෂි ඉදිරිපත් නොවීම හේතුවෙන් එම විෂයයන් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි වුණි.

(ආ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් වූ උපලේඛනයට අනුව ඉඩම් 98 ක් පැවතියත් ස්ථාවර වත්කම් ලේඛනයේ ඉඩම් 52 ක් පමණක් සටහන් කර තිබුණු අතර අනෙකුත් ඉඩම් 46 සඳහා ඔප්පු සභාව සතුව නොතිබුණි.

## 02 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.28,333,922 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම රු. 32,195,720 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,861,798 ක පිරිහීමක් පැවතුණි. මෙකී මෙහෙයුම් ප්‍රතිඵලයට රු.17,497,917 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.37,290,268 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රතිඵලය රු.8,541,571 ක අතිරික්තයක් බවට පත්ව තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාල තථ්‍ය ආදායම, වියදම හා අදාල විචලනයන් පහත දැක්වේ.

| | ආදායම | | | | වියදම | | |
|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | 2015 | 2014 | විචලනය | වියදම් විෂයය | 2015 | 2014 | විචලනය |
| | රු.000 | රු.000 | රු.000 | | රු.000 | රු.000 | රු.000 |
| (i) උත්පාදිත ආදායම | 24,253 | 15,309 | 8,944 | පෞද්ගලික පඩිනඩි | 84,485 | 61,418 | 23,067 |
| (ii) වෙනත් | 124,660 | 101,558 | 23,102 | අනෙකුත් | 36,094 | 23,253 | 12,841 |
| උප එකතුව | 148,913 | 116,867 | 32,046 | උප එකතුව | 120,579 | 84,671 | 35,908 |
| (iii) ප්‍රාග්ධන ආදායම | 17,498 | 58,738 | (41,240) | ප්‍රාග්ධන වියදම | 37,290 | 102,535 | (65,245) |
| මුළු එකතුව | 166,411 | 175,605 | (9,194) | මුළු එකතුව | 157,869 | 187,206 | (29,337) |
| මෙහෙයුම් ප්‍රතිඵලය | 28,334 | 32,196 | (3,862) | අතිරික්තය/ ඌනතාවය | 8,542 | (11,601) | 20,143 |

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.148,913,256 න් දළ වශයෙන් සියයට 83.7 ක් හෙවත් රු.124,660,507 ක්ම සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම්වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.17,497,917 ක මුළු ප්‍රමාණයම ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මඟින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලැබී තිබුණි. එය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 70 ක අඩුවීමක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.120,579,333 න් දළ වශයෙන් සියයට 70 ක් හෙවත් රු.84,485,263 ක් පෞද්ගලික පඩිනඩි සඳහා වියදම වූ අතර ඉන් දළ වශයෙන් සියයට 89 ක් හෙවත් රු.75,006,692 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් වෙතින් ලැබී වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී පුනරාවර්තන වියදම සියයට 42 ක් ඉහළ ගොස් තිබුණි.

(ඈ) ප්‍රාග්ධන වියදම වූ රු.37,290,268 න් දළ වශයෙන් සියයට 6.3 ක් හෙවත් රු.2,346,284 ක් පමණක් සභා අරමුදල් වැය වූ අතර ඉතිරි සියයට 93.7 ක් වූ රු.34,943,984 ක ප්‍රමාණය ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභව මත වෙනත් ආයතනවල ප්‍රතිපාදන වලින් ඉටුකළ සංවර්ධන කාර්යයන් විය. එය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 63 කින් සංවර්ධන කාර්යයන් සඳහා ප්‍රතිපාදන යෙදවීම අඩුවී තිබුණි.

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂයට අදාළ ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම හා හිඟ ආදායම පහත පරිදි වේ.

| | 2015 | | | 2014 | | |
|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තත්‍ය | දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තු ගත | තත්‍ය | දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 9,252 | 11,177 | 7,025 | 8,352 | 6,183 | 6,198 |
| (ii) බදුකුලී | 7,898 | 6,160 | 2,304 | 6,619 | 5,446 | 3,205 |
| (iii)බලපත්‍ර ගාස්තු | 3,126 | 487 | - | 2,585 | 657 | - |
| (iv) වෙනත් ආදායම් | 91,242 | 56,083 | 55,546 | 93,634 | 104,514 | 50,377 |
| එකතුව | 111,518 | 73,907 | 64,875 | 111,190 | 116,800 | 59,780 |

### 2.3.2 බිල්කළ ආදායම හා හිඟහිටි ආදායම්

වර්ෂයේ බිල්කළ ආදායම හා ඒ මත හිඟහිටි ආදායම් පහත සඳහන් පරිදි විය.

| | | | | | ආදායම් රැස් කිරීම | | | හිඟහිටි ශේෂය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | 2015/01/01 දිනට හිඟය | වර්ෂයේ බිල් කිරීම් | එකතුව | 2015/01/01 දක්වා හිඟයෙන් | බිල්කළ ආදායමින් | එකතුව | 2015/01/01 දිනට පැවති හිඟයෙන් | බිල්කළ ආදායමින් | 2015/12/31 දිනට මුළු හිඟය |
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු.000 |
| වරිපනම් හා බදු (10) | 6,198 | 9,628 | 15,826 | 2,152 | 6,649 | 8,801 | 4,046 | 2,979 | 7,025 |
| බදු කුලී (20) | 3,205 | 5,638 | 8,843 | 1,592 | 4,947 | 6,539 | 1,613 | 691 | 2,304 |
| බලපත්‍ර ගාස්තු (30) | - | 256 | 256 | - | 256 | 256 | - | - | - |
| වෙනත් ආදායම් (40,50,60,70) | 31,125 | 116,994 | 148,119 | 30,409 | 62,164 | 92,573 | 716 | 54,830 | 55,546 |
| එකතුව | 40,528 | 132,516 | 173,044 | 34,153 | 74,016 | 108,169 | 6,375 | 58,500 | 64,875 |

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වරිපනම් හා බදු යටතේ සමාලෝචිත වර්ෂයේ රු.9,628,000 ක ආදායමක් බිල්කර පැවතියද, එයින් අයකර පැවතියේ රු. 6,649,000 ක් හෙවත් සියයට 69 ක් පමණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.7,024,887 ක හිඟයක් පැවතුණි.

(ආ) පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ ප්‍රමාණය රු.596,334 ක්ද මුද්දර ගාස්තු රු.30,528,578 ක්ද විය.

(ඇ) වත්කම් බදුදීමේදී ගිවිසුමෙහි 4 හා 5 වගන්ති ප්‍රකාරව ඒ ඒ මාසයේ වාරික මුදල් ඊළඟ මාසයේ 10 දිනට පෙර ගෙවිය යුතු අතර වාරික මුදල් ගෙවීමට ප්‍රමාද වන්නේ නම් ඒ සඳහා සියයට 10 ක දඩ මුදලක් අයකල යුතුය. එහෙත් වාරික මුදල් ප්‍රමාද වී ගෙවීම් කර තිබූ වත්කම් 03 ක් වෙනුවෙන් අයකල යුතු රු.28,517 ක දඩ මුදලක් අයකර නොතිබුණි.

(ඈ) පොල්ගහවෙල පොදු වෙළඳපොල කඩ කාමර 54 ක් දීර්ඝකාලීන බදුදීම් යටතේ මාසික කුලියට බදුදීමේදී ගිවිසුමෙහි 06 (අ) වගන්ති ප්‍රකාරව මාසික කුලී මුදල් ඒ ඒ මාසයේ 10 වෙන දින හෝ ඊට ප්‍රථම සභාවට ගෙවිය යුතු අතර වාරික මුදල් ගෙවීමට ප්‍රමාද වන්නේනම් ඒ සඳහා සියයට 10 ක වරෙන්තු ගාස්තුවක් අයකල යුතුය. එහෙත් 2015 වර්ෂය සඳහා කඩ කාමර අංක 01 හා 02 ට අදාලව මාසික කුලී මුදල් ගෙවීමේදී ප්‍රමාදවී ගෙවීම් කර තිබූ මාසික කුලී මුදල් වෙනුවෙන් අයකල යුතු රු.21,000 ක වරෙන්තු ගාස්තුවක් අයකර නොතිබුණි.

(ඉ) 2004 වර්ෂයේ බන්දාව එළ හරක් මස් කඩය වෙනුවෙන් වූ හිඟ බදු මුදල වූ රු.124,424 ක් අයකර ගැනීම සඳහා වූ නඩුව වර්තමානයේ ක්‍රියාත්මක නොවන අතර එම බදු මුදල අයකර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ගයන් හඳුනාගත නොහැකි විය.

(ඊ) 2007 වර්ෂයේ පොදු වෙළඳපල අංක 45 හා 46 එළ හරක් මස් කඩ වෙනුවෙන් අයවිය යුතු රු.117,104 ක මුදල අයකර ගැනීම සඳහා නඩු පවරා එම නඩුවෙන් මෙම මුදල් ගෙවිය යුතු බව තීරණය වූවත් වර්තමානයේ එම පුද්ගලයන් සොයාගත නොහැකි වීම නිසා එම මුදල් අයවීමේ අවිනිශ්චිතතාවයක් පැවතිණි.

(උ) 1991 වර්ෂයේදී පොල්ගහවෙල ලංකා බැංකුවට ලබා දුන් බදු දේපල සඳහා රු.41,250 ක හිඟ කුලිය 2015 වර්ෂය වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ඌ) විදුලි රාජකාරි කාමරය සඳහා හිඟ කුලී ලෙස සටහන් වන රු.7,192 ක් අයවිය යුතු පාර්ශව නිශ්චිත වශයෙන් හඳුනාගත නොහැකි අතර මෙම හිඟය අයකර ගැනීම පිළිබඳ අවිනිශ්චිතතාවයක් පැවතිණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 පෙබරවාරි 10 දිනැති ගිවිසුම ප්‍රකාරව මාසිකව රු.30,000 ක මුදලකට පොල්ගහවෙල පොදු වෙළඳපොළ අංක 01 හා 02 දරන කඩ කාමර සතොස ආයතනයට ලබාදී තිබුණද, පෙර ගිවිසුම් වගන්ති ප්‍රකාරව අංක 47 කඩ කාමරය රු.850 ක මාසික මාසික ගාස්තුවකටද සතොස ආයතනය විසින් භාවිතා කර තිබුණු නමුත් මාසිකව ගාස්තු අයකර නොතිබුණි.

(ආ) 2010 සැප්තැම්බර් 27 දින අංක කුරු/කුපු/1759 දරන තක්සේරු වාර්තාව ප්‍රකාරව අංක 47 කඩ කාමරය සඳහා මාසික රු.850 ක තක්සේරු වටිනාකමක් ලබාදී තිබුණද 2011 පෙබරවාරි සිට සභාව විසින් අංක 47 කඩ කාමරය සඳහා බිල් කිරීම් කර අදාල මුදල් අය නොකිරීම මත රු.50,150 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

(ඇ) වසර දෙකකට අධික කාලයක සිට නිරවුල් නොකර පවතින තැන්පතු ශේෂවල වටිනාකම රු.1,029,509 ක්ව තිබුණි.

(ඈ) සේවක අර්ථසාධක අරමුදලින් සභාව වෙත ලැබී තිබූ රු.440,517 ක් වටිනා සේවක අර්ථසාධක අරමුදල් අදාල ප්‍රතිලාභීන් තිදෙනෙකුට නිරවුල් කිරීමට කටයුතු නොකර තැන්පතු යටතේ රඳවාගෙන තිබුණි.

(ඉ) ඉඩම් කට්ටි කර විකිණීමේදී සභාවට අයකර ගත යුතු සියයට 1 බදු මුදල ගණනය කිරීමේදී නිවැරදි විකුණුම් වටිනාකම් මත බදු ගණනය නොකිරීම නිසා පර්චසයක මිල රු.52,000 සිට රු.137,500 ක් වටිනා වීරඹුගෙදර හංවැල්ල වගුරුවෙල පිටිය ඉඩමේ පර්චස් 594 කට අදාල රු.323,398 ක්ද, පර්චසයක් රු.85,000 සිට අලෙවි කරන ලද දඹගහමුල්ල වත්ත පිදුරුවැල්ල ඉඩමේ පර්චස් 171.4 කට අදාලව රු.93,239 ක් පමණක්ද අයකර තිබුණි.

### 3.2 අවිධිමත් ගනුදෙනු

වයඹ පළාතේ ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා නායකත්වය ලබාදෙන පළාත් පාලන ආයතනවල නියෝජිතයින් ඔවුන්ගේ රාජකාරි කටයුතුවලට යතුරු පැදියෙන් ගමන් කිරීම සඳහා මසකට උපරිම ලෙස රු.3,000 ක ඉන්ධන දීමනාවක් සහා අරමුදලින් ලබාදීම සඳහා වයඹ පළාත් ආණ්ඩුකාරවරයාගේ 2012 ජුනි 11 දිනැති අංක NWP/GOV/AD/2/24/5 දරන අනුමැතිය ලබාදී තිබුණද තම රාජකාරි කටයුතු සඳහා නිල වාහනයක් හා ඊට අදාල ඉන්ධන සභාව විසින් සපයනු ලබන සභාපතිට 2012 ජූලි සිට 2015 ජූලි දක්වා රු.111,000 ක මුදලක් ඉන්ධන දීමනා වශයෙන් ගෙවා තිබුණි.

### 3.3 හඳුනාගත් අලාභ

සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් මණ්ඩලය වෙත නියමිත දිනට මුදල් නොගෙවීම මත 2015 මාර්තු 02 දින රු.20,119 ක අධිභාර මුදලක් ගෙවා තිබුණි.

## 04 <u>යහපාලනය හා ගිණුම්කටයුතු භාවය</u>

### 4.1 <u>වත්කම් කළමනාකරණය</u>

### 4.2 <u>නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්</u>

සමාලෝචිත වර්ෂයේ මෝටර් රථ හා කරත්ත ගිණුමේ ඇතුලත් අංක 68-3676 දරන රු.1,255,000 ක් වටිනා ටිපර් රථය හා අංක LF-4884 දරන රු.1,319,050 ක් වටිනා බෙල්රෝ ජීප් රථය පිළිවෙලින් 2013 හා 2014 වර්ෂයේ සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

## 05 <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය